මාතර මහා නගර සභාව

<u>මාතර දිස්ත්‍රික්කය.</u>

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණද, මාතර මහා නගර සභාවේ ගණන්දීමේ නිලධාරියා වශයෙන් නගරාධිපති සහතික කර නොතිබුණි. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 15 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 17 දිනද සභාවට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂය අවසාන දිනට පැවති රු.256,483 ක් වූ ආයුර්වේද ඖෂධ තොගය සහ රු.526,812 ක් වූ වාහන සේදුම් මධ්‍යස්ථානයේ ඉතිරි තොගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවෙන ආකාරයට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂයේ ගබඩාවෙන් නිකුත් කිරීම් රු.811,066 ක් අඩුවෙන් ගණනය කිරීම නිසා අවසාන තොගය එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 අවසාන ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සැපයුම්කරුවෙක් සමඟ බැඳීම ඇතිකර නොතිබූ රු.8,750,000 ක් වටිනා ගලි රථය මිලදී ගැනීමට විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | එකම වියදම සඳහා වර්ෂ දෙකකදී ප්‍රතිපාදන වෙන් කිරීමට සිදුවිය. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කර්මාන්ත ඉදිකිරීම් අත රැඳවුම් රු. 479,296 ක් ණයහිමි හා තැන්පතු ශේෂය තුල අන්තර්ගතවී තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 අවසාන ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කරමි. |
| (v) | ඉකුත් වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ මෝටර්රථ හා කරත්ත ගිණුමේ ශේෂය හා සභාව සතු මෝටර් රථ හා කරත්ත භෞතික ශේෂය අතර වූ වෙනස ජ්'නල් සටහන් 4 මගින් ගැලපීම් කිරීමේදී රු.1,669,000 ක් වටිනා ට්‍රැක්ටර් 02 ක වටිනාකම ඇතුළත් නොවීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු.1,669,000 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) | ඉකුත් වර්ෂය අවසානයට වරිපනම් බදු පාලන ගිණුමේ ශේෂය සහ වරිපනම් බදු මෘදුකාංග සටහන අනුව ශේෂය අතර වූ රු.8,284,866 ක වෙනසට හේතු නිවැරදිව හඳුනා නොගෙන ජ්'නල් සටහන් අංක 51 මගින් සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු. 8,284,866 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (vii) | සමාලෝචිත වර්ෂය අවසානයට බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණ ණය ගිණුමේ හා ශේෂ සනාථ කිරීම් අතර වූ රු.7,466,103 ක වෙනසට හේතු නිවැරදිව හඳුනා නොගෙන ජ්'නල් සටහන් අංක 49 මගින් සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදල් ගිණුම රු.7,466,103 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ණය ශේෂයේ තහවුරුවක් ලබාගෙන 2020 ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ඉදිකිරීමේ වියදම් වෙනුවෙන් රු. 969,719 ක් වැඩියෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඇස්තමේන්තු මුදල හා බිල් වටිනාකම් අතර ඇති වෙනස ජ්'නල් සටහන් මගින් නිවැරදි කරමි. |
| (ix) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු කර්මාන්ත ණයගැති වෙනුවෙන් රු.1,775,587 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කරමි. |
| (x) | ඉකුත් වර්ෂයේ වෙන්දේසියෙන් ඉවත් කර තිබූ ස්ථාවර වත්කම්වල පිරිවැය නිශ්චිතව හඳුනා නොගෙන රු.1,389,280 ක වටිනාකමක් ගිණුම්වලින් ඉවත්කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉවත් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනවලින් නිවැරදිව හඳුනාගත නොහැක. |
| (xi) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු එකතුව රු.46,898,225 ක් වූ දායකය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා ඉදිරි කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (xii) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කරමි. |
| (xiii) | ඉන්ධන පිරවුම්හල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරු සමඟ සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්ගතවී නොතිබුණද, ඒ වෙනුවෙන් රු.50,000,000 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | එකම වියදම සඳහා වර්ෂ දෙකකදී ප්‍රතිපාදන වෙන් කිරීමට සිදුවිය. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.77,132,972 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 17,934,458 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.65,109,174 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමට හා වෙනස්කම් පිළිබඳ විමසීම් කරමින් ඇත. |

## 1.4 අනුකූල නොවීම

------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 2ක් ඉක්මවූ වටිනාකම රු.9,749,163 ක්වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ගැලපීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මහා නගර සභාව සතු වාහන 21 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අලුත් වැඩියා කිරීමෙන් පසු ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළෙමි. |
| (ඇ) | අංක 01/2018 හා 2018 මාර්තු 19 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | භාවිතයෙන් ඉවත් කර තිබූ වාහන හා යන්ත්‍ර 10 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 6 ට අදාළ මුල් ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසු අපහරණය කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ I, 3 වන වගන්ති හා XII වන පරිච්ඡේදය. | ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ I වන වගන්තිය ප්‍රකාරව තනතුරෙන් මුදා හැරීමකින් තොරව කාර්යාල කාර්ය සහායකයෙකු විසින් ක්‍රීඩා පුහුණු තනතුරකට වාර්තා කර තිබූ අතර ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 3වන වගන්තියට අනුකූලනොවන පරිදි නැවත සේවයේ පිහිටුවීම සිදුකර තිබුණි. තවද කලින් දැනුම්දීමක් සිදු නොකර සේවයට නොපැමිණ තිබියදී ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදය ප්‍රකාරව දින 06 ක අනියම් නිවාඩු අනුමත කර තිබුණි. | ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 1,3 වගන්ති හා XII වන පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | කාර්යාල කාර්ය සහායක ක්‍රීඩා පුහුණුකරු පත්වීමක් ලබා ගන්නා බව ලිඛිත දැනුම්දීමක් සිදුකර නොමැති බැවින් තනතුරෙන් මුදාහැරීමක් සිදුකර නොමැති අතර, එසේ මුදාහැරීමක් සිදු නොකළ බැවින් නැවත සේවයේ පිහිටුවීම අවශ්‍ය නොවේ. ඔහු සේවයට නොපැමිණෙන බව එවකට නාගරික කොමසාරිස් වෙත වාචිකව දැනුම්දී තිබූ අතර, නැවත සේවයට පැමිණි පසු නිවාඩු අනුමත කර ගෙන ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.122,101,310 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.132,779,713 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ 10 ත් වර්ෂ 28 ත් අතර කාල පරිච්ඡේදයකට අයත් රු.34,943 ක් වූ අහරු චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිශ්චිත තොරතුරු සොයාගැනීමට නොහැකි බැවින් සභාව වෙත යොමුකර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ජංගම වත්කම් යටතේ පැහැරගත් මුදල් ශේෂයක් ඇතුළත් කිරීම නිසා, ජංගම වත්කම් තුළ රු.169,360 ක ව්‍යාජ වත්කම් ඇතුළත් වී තිබූ අතර අදාළ මුදල පැහැර ගැනීම සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම පැහැරගත් මුදල් ශේෂය සම්බන්ධයෙන් පැහැදිලි තොරතුරක් වාර්තා නොවන අතර, අදාල ශේෂය පෙර වර්ෂ වල සිට පැවත එන්නකි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 38,761,718 | 38,053,546 | 44,125,891 | 50,003,159 | 41,384,570 | 38,481,722 | 43,527,300 | 56,075,504 |
| කුලී | 29,123,440 | 31,946,301 | 30,289,545 | 60,416,031 | 26,381,440 | 30,606,691 | 29,824,618 | 58,759,275 |
| බලපත්‍ර ගාස්තු | 30,183,550 | 27,224,055 | 10,654,745 | 17,955,970 | 26,874,700 | 30,135,817 | 25,683,882 | 1,386,660 |
| වෙනත් ආදායම් | 157,304,310 | 176,479,328 | 123,468,522 | 380,590,008 | 93,542,300 | 113,606,910 | 4,791,667 | 327,579,202 |
| එකතුව | 255,373,018 | 273,703,230 | 208,538,703 | 508,965,168 | 188,183,010 | 212,831,140 | 103,827,467 | 443,800,641 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **වරිපනම්** | | |
| ආරම්භක හිඟය රු.47,569,728 ක් වූ අතර, රු.36,346,183 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමග රු.83,915,911 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුල මුළු අයවීම් රු. 34,080,336 ක් හෙවත් සියයට 41 ක අගයක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.49,835,575 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

### 2.3.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **කඩ කුලී** | | |
| | ආරම්භක හිඟය රු.46,582,253 ක් වූ අතර, රු.23,803,065 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.70,385,318 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුල මුළු අයවීම් රු.23,418,415 ක් හෙවත් සියයට 33 ක අගයක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.46,966,903 ක් තරම් ඉහළ මට්ටමක පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | **බිම්බදු** | | |
| | ආරම්භක හිඟය රු.6,791,736 ක් වූ අතර, රු.879,195 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.7,670,931 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුල මුළු අයවීම් රු.7,670,931ක් හෙවත් සියයට 33 ක අගයක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.7,416,334 ක් තරම් ඉහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ අයකර ගැනිම සඳහා ලිපි මගින් දැනුවත් කිරීම, සමථ මණ්ඩලය වෙත යොමු කිරිම, බිම් බදු කරුවන් කැඳවා දැනුවත් කිරිම සිදුකර ඇත. |

## 2.3.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වෙළඳ බලපත්‍ර ගාස්තු** | | |
| ආරම්භක හිඟය රු. 7,338,545 ක් වූ අතර, රු.9,686,850 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.17,025,395 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුල මුළු අයවීම් රු.9,567,600 ක් වීම නිසා වර්ෂය අවසානයට හිඟය රු.7,457,795 ක අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ මුදල සඳහා නඩු පවරා අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) දැන්වීම් පුවරු ගාස්තු** | | |
| ආරම්භක හිඟය රු.11,265,342 ක් වූ අතර, රු.15,566,180 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.26,831,522 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුල මුළු අයවීම් රු.16,336,348 ක් හෙවත් සියයට 61 ක අගයක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.10,495,174 ක අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ මුදල සඳහා නඩු පවරා අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2.3.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.313,897 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.373,598,210 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්ය සාධනය

----------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන, සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථා** | | |
| | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් පදික වේදිකාවල වාහන නතර කිරීම සඳහා රු. 50 ක් සහ රු.100 ක් වශයෙන් ගාස්තු අයකර වාහන නැවතුම් ස්ථාන 06 ක් ආරම්භ කර තිබූ අතර මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සම්මත කර නොතිබුණි. මහජන පැමිණිලි හේතුවෙන් මෙම ක්‍රියාවලිය අතරමග නතර කර තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සම්මත කර ගත යුතුවේ. | ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ආ) | **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්** | | |
| | සමාලෝචිත වර්ෂයේ රු. 3,749,093 ක ගිවිසුම් වටිනාකමක් ඇති ඉදිකිරීම් කර්මාන්ත 03 ක් ඉටු කිරීම සඳහා අනුමත සමිති 02 ක් හා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගතවී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි. තවද ගිවිසුම්ගත එක් කර්මාන්තයකට රු.462,235 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. | ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුවේ. | මෙම කර්මාන්ත අනුමත වූ කාල පරාසය තුල අධික වර්ෂාව දිගින් දිගටම පැවතීම නිසා 2019 වර්ෂය තුලදී මෙම කර්මාන්ත ක්‍රියාත්මක කර අවසන් කල නොහැකිවිය. |
| (ඇ) | <u>**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**</u> | | |
| | 2015 සිට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් දක්වා වසර 04 ක කාලයක් තුළ දිරන කසල හා ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කසල අක්‍රමවත් ලෙස කොටවිල කසල කළමනාකරණ අංගනයේ අවිධිමත්ව බැහැර කිරීමෙන් අඩි 20 ක් පමණ විශාල කසළ කන්දක් නිර්මාණය වී තිබුණි. | පාරිසරික ගැටළු නොවන ආකාරයෙන් කසල බැහැර කළ යුතුවේ. | කසළ මගින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියේ (waste to energy) ඉදිකිරීම් කටයුතු සඳහා මාතර මහා නගර සභාවට අයත් කොම්පෝස්ට් අංගනය සහ කසළ තේරීමේ පරිශ්‍රය බයෝග්‍රීන් සයිකල් පුද්ගලික සමාගමට ලබාදීමට සිදුවීම |

| | | |
|---|---|---|
| | | හේතුවෙන් දිරන කසළ මගින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය නතර කිරීමට සිදුවිය. නව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අපේක්ෂිත කාලරාමුව තුළ නිමකර ගැනීමට නොහැකිවීම යන කරුණු හේතුවෙන් එක්රැස් කරනු ලැබූ කසළ විවෘත භූමියට බැහැර කිරීමට සිදුවූ අතර, ඒ හේතුවෙන් කසළ කන්දක් ලෙස නිර්මාණය විය. මේ වන විට එම ස්ථානයේ ගොඩගැසී ඇති කසළ කන්ද පස් වලින් වැසීම සිදුකර ඇති අතර, ඉදිරියේ දී එම ස්ථානයේ පැල සිටුවීම මගින් හරිත කලාපයක් ලෙස සකස් කිරීමට කටයුතු කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අක්කර 03 රූඩ් 02 පර්චස් 37.76 ක් වූ බ්‍රවුන්ස්හිල් පාරේ පිහිටි පර්ල් ක්ලිප් නැමති ඉඩම, අනුබෙදුම් කිරීමේදී මුළු ඉඩමේ ප්‍රමාණයෙන් සියයට 10 ක ප්‍රමාණයක් වූ රූඩ් 01 පර්චස් 19.7 ක් පොදු කටයුතු සඳහා වෙන්කර සභාවට පැවරිය යුතු වුවත් පොදු කටයුතු සඳහා යොදාගත නොහැකි දළ බෑවුමක් සහිත පර්චස් 15.7 ක බිම් තීරුවක් සභාවට වෙන්කර තිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉඩම වෙන් කර පෙන්වා නොමැති බවද 2020 ජනවාරි 20 දින පැවති මහජන පෙත්සම් කාරක සභාවේදී තීරණ අංක 2019/මාමනස/මහජනපෙත්සම් /03 යටතේ දින 14ක් ඇතුළත නැවත ඉඩම් කොටස මැන පවරා දෙන ලෙසට දන්වා යැවීමට ගන්නා ලද තීරණය , 2020 ජනවාරි 11 දින පැවති මහා සභාවේදී අංක 203 ඉ.8 දරන සභා තීරණය මගින් අනුමත කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පදික වේදිකා සහ පොදු ස්ථාන අවහිර වන සේ ඉදිකර තිබූ අනවසර වෙළඳසැල් 11ක් සම්බන්ධයෙන් සභාව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර වෙළඳාම ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | අනවසර වෙළඳාම ඉවත් කර ගන්නා ලෙස දැනුවත් කර ඇති අතර මේවන විට ඉන් කීපයක් ඉවත් කර ගෙන ඇති බවත්, අනෙකුත් ව්‍යාපාර එම ස්ථානයෙන් ඉවත් කර ගැනීමට කටයුතු කරන මෙන් උපදෙස් ලබා දී ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ----------------------------------------- |

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් , තෘතීයික මට්ටමේ තනතුරු 03 ක් , ද්විතීයික මට්ටමේ තනතුරු 23 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 51 ක් පුරප්පාඩු ලෙසද, ද්විතීයික හා ප්‍රාථමික මට්ටමේ තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ ඇතුළත් අතිරික්ත තනතුරු 12 ක් ඇතුළුව 110 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සහ අතිරික්ත විධිමත් කිරීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ ජ්‍යෙෂ්ඨ තනතුරු 02 ක් සම්පූර්ණ වී ඇති අතර, එක් තනතුරක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරන අතර, තෘතීයික හා ද්විතීයික මට්ටමේ සමහර තනතුරුද බඳවා ගැනීමට කටයුතු යොදා ඇති අතර මහජන සෞඛ්‍ය පරික්ෂක හා පවුල් සෞඛ්‍ය නිලධාරින්ගේ පවතින පුරප්පාඩු තනතුරු සෞඛ්‍ය අධ්‍යක්ෂක කාර්යාලයේ නිලධාරීන් යොදවා ගන්නා බව , ප්‍රාථමික අංශයේ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවාගෙන ඇති අතර ඉතිරි පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමි. අතිරික්ත තනතුරු 2020 හා 2021 වර්ෂවල ඉදිරි අවශ්‍යතා සඳහා සාධාරණීකරණ වාර්තාවක් මඟින් අනුමත කරවා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇත. |

**(ආ) සේවක ණය**

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂ 10 කට පෙර විශ්‍රාම ගිය, මියගිය, සේවය අතහැර ගිය සහ ස්ථානමාරුවී ගිය සේවකයින්ගේ ආපදා ණය, උත්සව අත්තිකාරම්, විශේෂ ණය, වාහන ණය සහ ගංවතුර අත්තිකාරම් සඳහා ලබාදුන් රු.330,229 ක ණය ශේෂයක් අයවීමට තිබුණි. | සේවක ණය කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගයක් පිළිබඳව තීරණයක් ගැනීම සඳහා සභාවට යොමු කරන ලදී. සභා තීරණය අනුව පොත්වලින් කපා හැරීමට විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමුකර ඇතත් මෙතෙක් මෙයට පිළිතුරක් හෝ වෙනත් කිසිදු උපදෙසක් ලබාදී නොමැත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු සනත් ජයසූරිය ක්‍රීඩාංගණය ගාස්තු අයකිරීමකින් තොරව හා සභා තීරණයක් නොමැතිව සාහිත්‍ය ප්‍රදීප රුහුණු පොත් වසන්තය වෙනුවෙන් ලබාදී තිබූ අතර ප්‍රදර්ශනය පැවැත්වූ කාලය තුළ භූමිය තුළ පිහිටා තිබූ අලෙවි කුටි 41 කින් ප්‍රචාරක දැන්වීම් පුවරු 31 කින් හා කොඩි කණු වෙනුවෙන් ගාස්තුද අයකර ගෙන නොතිබුණි. | අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | වාහන නැවතුම් ස්ථාන 06 කින් ගාස්තු අයකිරීම සඳහා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව තෙවන පාර්ශවයක් වෙත ලබාදී තිබුණි. | ටෙන්ඩර් පටිපාටිය අනුව කටයුතු කළ යුතුවේ. | නියමු ව්‍යාපෘතියක් ලෙස පදික වේදිකාවල නතර කර ඇති වාහන වලින් ගාස්තු අය කිරීමට 2018 දෙසැම්බර් 11 දින අංක 07:01 (2018/මාමනස/මුදල් ප්‍ර/11) සභා සම්මුතිය අනුව කටයුතු කර ඇත. |
| (ඇ) | කොටුවේගොඩ, ධර්මපාල මාවතේ වාණිජ භාවිතය වෙනුවෙන් ඉදිකර තිබූ අනවසර ගොඩනැඟිල්ලට ආවරණ අනුමැතිය ලබාදීම සඳහා ඉදිරිපත් කර තිබූ සංවර්ධන බලපත්‍රය 2010-2030 මාතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහාවූ සංවර්ධන සැලැස්මේ (II වෙළුම) සැලසුම් හා ගොඩනැඟිලි රෙගුලාසි ප්‍රකාරව ගොඩනැඟිලි සීමා නියමිත පරිදි නොතිබූ අතර රු.298,740 ක ගාස්තු අඩුවෙන් අයකර තිබුණි. තවද වාහන නැවතුම් ස්ථාන 3 ක් සඳහා රු.1,000,000 ක් අඩුවෙන් අයකර තිබුණි. | 2010 – 2030 මාතර නාගරික සංවර්ධන බලප්‍රදේශ සඳහා වූ සංවර්ධන සැලැස්මේ (iiවෙළුම) සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රදේශය භාර තාක්ෂණ නිලධාරි වාර්තාව පදනම් කරගෙන පැරණි පිහිටි ගොඩනැගිල්ලක් සේ සලකා සීමාවන් සැලකිල්ලට නොගෙන ගාස්තු අයකර ඇත. |
| (ඈ) | සභාව සතු කොටුවේගොඩ නිවාස සංකීර්ණයෙහි ප්‍රතිලාභීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ ජූලි 31 දිනට රු. 4,428,352 ක හිඟ බදු කුලියක් අයවීමට තිබූ අතර කොටුවේගොඩ පරණ පාර නිවාස යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභීන් 08 දෙනෙකුගෙන් රු.90,960 ක හිඟ බදු කුලියක් අයවීමට තිබුණි. | කඩිනමින් හිඟ කුලි අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පරණ තංගල්ල පාර නිවාස යෝජනා ක්‍රමයේ ඉඩම් අයිතිය නිශ්චය කර ගැනිමෙන් පසු මෙම බිම් බදු ලේඛනයේ නම් සඳහන් ස්ථාන සභාව සතු දේපලක් වන්නේ නම් ඒ අනුව ඉදිරි පියවර ගන්නා බව හා පරණ මාර්කට් පාර ප්‍රතිලාභින් සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබා ගෙන මුදල් කමිටුව වෙත යොමුකර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |

## 3.5 අවිධිමත් ගනුදෙනු

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව සතු වල්ගම පුස්තකාලයේ වාර්ෂික ජල ගාස්තුව රු.146,568 ක් වූ අතර මාසික සාමාන්‍ය ජල ගාස්තුව රු. 12,214 ක් විය. එහෙත් පසුගිය වර්ෂයේ වාර්ෂික ජල ගාස්තුව රු.8,432 ක්වූ අතර මාසික සාමාන්‍ය ජල ගාස්තුව රු. 703 ක් තරම් පහල මට්ටමක පැවතුණි. ඒ අනුව ජල භාවිතයේ අසාමාන්‍ය තත්ත්වයක් පෙන්නුම් කෙරුණි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු අයගෙන් අය කළයුතු වේ. | ජල මීටරයෙන් මෙපිට නළ තුළ සිදුවන කාන්දුවක් බව අනාවරණය වු බැවින් සභාවේ ජල නල කාර්මික විසින් නව නළ පද්ධතියක් සකස් කර එහි ගැටළුව නිරාකරණය කලෙමි. |

## 3.6 වත්කම් කළමණාකරණය

-----------------------------

### 3.6.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

---------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාතර මහා නගර සභාව සතු උයන්වත්ත පාපන්දු ක්‍රීඩාංගනය විධිමත් පැවරීමකින් හා ගාස්තු අය කිරීමකින් තොරව පාපන්දු සම්මේලනය විසින් 2009 වර්ෂයේ සිට පරිහරණය කරමින් තිබුණි. සභාවේ අනුමැතියකින් තොරව රු.5,000,000 කට අධික වටිනාකමින් යුතු මෙම ඉඩම තුළ ක්‍රීඩා මණ්ඩපයක් හා කාර්යාලයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර පාපන්දු සම්මේලනය විසින් මෙම ක්‍රීඩාංගනය බදු දීමෙන් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ ජුනි දක්වා රු.1,302,100 ක ආදායමක් උපයාගෙන තිබුණි. | විධිමත් පැවරීමක් කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | අංක දපපා/15 හා 2007 මාර්තු 19 දිනැති දකුණු පළාත් ,පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු සෑම දේපලක්ම නැවත මැන නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි . | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දැනට සභාවේ කර්මාන්ත අංශය විසින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු පර්චස් 40.91 කින් යුත් ඉඩම් 03 ක් සභාවේ අනුමැතියකින් තොරව පෞද්ගලික පාර්ශවයක් විසින් පරිහරණය කරමින් පැවතුණි. | නිතිමය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු අක්කර 101 රූඩ් 01 පර්චස් 2.43 ක් වූ ඉඩම් 99 කට අදාලව හිමිකම් ඔප්පු හා පිඹුරුපත් සකස් කර නොතිබුණි. | හිමිකම් ඔප්පු හා පිඹුරුපත් සකස්කල යුතුවේ. | කඩිනමින් ඔප්පු හා පිඹුරුපත් සකස් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 3.6.2 නිශ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------- |
| (අ) | අක්කර 07 රූඩ් 03 පර්චස් 18.235 ඉඩම් 57ක් ඵලදායී කාර්යයකට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ඵලදායී කාර්යයකට යෙදවිය යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජූලි 30 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සභා පරිශ්‍රය තුළ වාහන හා යන්ත්‍ර සූත්‍ර 24 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | ක්‍රියාකාරී තත්වයේ පවත්වා ගතයුතු වේ. | වාහන ගාල් කිරීමේ ගොඩනැගිලි නොමැති බැවින් රථගාල තුල නවතා ඇති වාහන මෙම තත්ත්වයට මුහුණපා ඇත. |

### 3.7 ප්‍රසම්පාදනය

### 3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණ අතර ඒ ඒ කාර්තු අවසානයේදී යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර යාවත්කාලීනව පවත්වා ගතයුතුවේ. | 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉදිරිපත් කරමි. |

### 3.7.2 සැපයීම් හා සේවා

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරිගේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ ද්විතියික සෞඛ්‍ය සංවර්ධන සැලැස්මේ ප්‍රතිපාදන මත මාතර කොටුවේගොඩ වෙරළ තීරයේ ළමා උද්‍යානය සඳහා උපකරණ සවිකිරීම වෙනුවෙන් පසුගිය වර්ෂයේ රු.3,477,933 ක වියදමක් දරා තිබූ අතර උපකරණ සවිකිරීමට පෙර ශක්‍යතා වාර්තාවක් සකස් කර නොතිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයට වඩා රු.1,099,990 ක් වැඩියෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් මිලදී ගැනීමට තීරණය කිරීමේදී ඊට අදාළව කරුණු පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. තවද උපකරණ මිලදීගෙන සවිකිරීමෙන් පසු ලද අදාළ උපකරණ නිසි ප්‍රමිතියකින් යුක්ත බව කාර්මික නිලධාරී වාර්තාවක් ලබාගෙන නොතිබුණි. 2019 සැප්තැම්බර් 10 දින වනවිට සියළු උපකරණ දිරා පත් වීමට ලක් වෙමින් පැවතුණි. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි ඇගයීම් කළ යුතුවේ. | ළමා උද්‍යානයක් පිහිටුවීමට සුදුසු ඉඩකඩ සහිත පහසුවෙන් ළඟා විය හැකි වෙනත් ස්ථානයක් සභාව සතුව නොමැති බැවින් ළමා උද්‍යානය මෙම ස්ථානයේ පිහිටුවා ඇත. |